**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ දුම්රිය කාර්ය සහායක /නවාතැන් බංගලා සහායක / කාන්තා විශ්‍රාමශාලා සේවිකා 111 වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා ඉල්ලුම්පත් කැඳවීම**

1.0 ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ දුම්රිය කාර්ය සහායක/නවාතැන්බංගලා සහායක/ කාන්තා විශ්‍රාමශාලා සේවිකා 111 වන ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින් එක් එක් තනතුරේ පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

3.0 පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 වැටුප :- අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව , දුම්රිය කාර්ය සහායක/නවාතැන් බංගලා සහායක/කාන්තා විශ්‍රාමශාලා සේවිකා 111 ශ්‍රේණියට අදාළ මාසික වැටුප් පරිමාණය PL 1 – 2016 - ඒ රු. 24,250/- 10 x250 /- 10 x270/- 10 x300 / - 12 x330/- රු.36,410/- වේ. රු. 27,020/= ඔබ්බට යාම සඳහා II වන ශ්‍රේණියට උසස් වීම ද රු. 29,750/= ඔබ්බට යාම සඳහා I වන ශ්‍රේණියට උසස් වීමද රු. 32,780/= න් ඔබ්බට යාම සඳහා විශේෂ ශ්‍රේණියට උසස් වීමද ලබා ගත යුතුය. එම චක්‍රලේඛයේ II වන උප ලේඛනයේ සඳහන් පරිදි ගෙවීම් සිදු කරනු ලැබේ.

5.0 තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට නිලධාරීන් යටත් විය යුතු වේ.

6.0 පළමු පත්වීම ලැබූ සේවා ස්ථානයේම අවම වශයෙන් වසර 05 ක් අනිවාර්යෙන් ම සේවය කළ යුතුය. කෙසේ වෙතත් පත්කිරීම් බලධරයා විසින් තීරණය කරනු ලබන යම් සුවිශේෂී හේතූන් මත එම කාලය අවසන් වීමට පෙර යම් නිලධාරියකු මාරු කිරීමට අවශ්‍ය වන්නේ නම් , පත්කිරීම් බලධරයා හට ඒ සඳහා බලය ඇත.

7.0 සුදුසුකම් :- දුම්රිය කාර්ය සහායක/නවාතැන් බංගලා සහායක/ කාන්තා විශ්‍රාම ශාලා සේවිකා III වන ශ්‍රේණියේ තනතුරු වලට බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් අදාළ වේ.

(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට වයස අවුරුදු 18 ට නො අඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

(ඇ) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඈ) **අධ්‍යාපන සුදුසුකම්:**
අ.පො.ස. (සා.පෙ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙක (02) ක් සහිතව විෂයන් හය (06) කින් සමත් වී තිබීම.

(ඉ) **වෘත්තීය සුදුසුකම්:**
ක්ෂේත්‍රයේ ලබා ඇති වෘත්තීය සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(ඊ) **පළපුරුද්ද :**
ක්ෂේත්‍රයේ ලබා ඇති පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(උ) සෑම අපේක්ෂකයෙකු ම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(ඌ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින්හි V වෙනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත් කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

සෑම අයදුම්කරුවකුම තනතුරට අදාළ සියලු සුදුසුකම් 2019.07.19 වන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

8.0 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :-

දුම්රිය සාමාන්‍යාධිකාරීගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වන දිනයේ දී ම පැවැත්වෙන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල තරයේ ම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් දුම්රිය කාර්ය සහායක/නවාතැන් බංගලා සහායක/ කාන්තා විශ්‍රාමශාලා සේවිකා III ශ්‍රේණියට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ.

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | අ.පො.ස. සා/පෙළ විභාගයේදී ගණිතය, ඉංග්‍රීසි භාෂාව , දෙවැනි භාෂාව සහ වෙනත් රාජ්‍ය භාෂා සඳහා සාමාර්ථයක් ලබා තිබීම. (උපරිම විෂයන් 5 ක් සළකා බලනු ලැබේ.) | 20 |
| වෘත්තීය සුදුසුකම් : තනතුරට අදාළව ලබා ඇති වෘත්තීය කුසලතා සහතික සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. | | 25 |
| තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද (උපරිම වසර 5 ක් සඳහා සලකා බලනු ලැබේ.) | | 40 |
| බාහිර ක්‍රියාකාරකම් (ක්‍රීඩා / සමාජසේවා ..... යනාදී ) | | 10 |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | | 05 |
| **එකතුව** | | **100** |

සටහන - තනතුරට ලබා ඇති පළපුරුද්ද , අධ්‍යාපන සුදුසුකම්, වෘත්තිය සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

9.0 ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් ඔහු හෝ ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10.0 අයදුම්පත මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ 4 (A4) ප්‍රමාණයේ කඩදාසියක , අයදුම්පතේ ශීර්ෂ අංක 1.0 සිට 3.5 තෙක් පළමුවන පිටුවට ද, 4.0 සිට 9.00 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන පරිද්දෙන් තම අයදුම්පත සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් භාවිතා කළ හැකිය. අයදුම්පතේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරන බැවින්, අයදුම්පත් යොමු කිරීමට ප්‍රථම එය කැඳවීම් නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පතට අනුකූල ද යන්න හා සියලු තොරතුරු අතුළත් කොට අයදුම්පත නිවැරදිව සම්පූර්ණ කර තිබේද ? යන්න පිළිබඳව නැවත විමසිලිමත් විය යුතුය.

11.0 නියමිත පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **"දුම්රිය සාමාන්‍යාධිකාරී, දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය , ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව, තැ.පෙ.355, ඕල්කොට් මාවත, කොළඹ 10"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ **" ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ( ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කරන්න ) III** වන **ශ්‍රේණියට බඳවා ගැනීම."**යන්න සඳහන් කරන්න.

12.0 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත 2019.07.19 දිනට හෝ එදිනට පෙර ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නො ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

14.0 මෙහි සඳහන් නො වන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව දුම්රිය සමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එම්.ජේ.ඩී.ප්‍රනාන්දු
**දුම්රිය සාමාන්‍යාධිකාරී**

2019 ජුලි මස 03 දින
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
තැ.පෙ.355,
ඕල්කොට් මාවත,
කොළඹ 10

**ආදර්ශ අයදුම්පත්‍රය**

**<u>ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ දුම්රිය කාර්ය සහායක /නවාතැන් බංගලා සහායක / කාන්තා විශ්‍රාම ශාලා සේවිකා 111 වන ශ්‍රේණියට බඳවා ගැනීම.</u>**

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| |
|---|
| |

අයදුම්කරන භාෂා මාධ්‍යය

සිංහල - 2

දෙමළ - 3

ඉංග්‍රීසි - 4

**ඉල්ලුම් කරනු ලබන තනතුරු පැහැදිලිව සඳහන් කරන්න** ..................................................................

1.0 1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම: ..................................................................

..................................................................................................................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා: GUNAWARDHANA , H.M.S.K

1.2 සම්පූර්ණ නම:- ..................................................................................................

...................................................................................(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම : -..................................................................................................

...................................................................................(සිංහලෙන්/දෙමළෙන්)

1.4 ජාතක හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය: ..................................................................................................

...................................................................................(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

2.2 ස්ථිර ලිපිනය: ..................................................................................................

...................................................................................(සිංහලෙන්/දෙමළෙන්)

2.3 පදිංචිය දුම්රිය නිවාසයකද / දුම්රිය රක්ෂිතයක ද යන වග:.........................................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය - ස්ත්‍රී – 1 පුරුෂ -0 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.2 විවාහක/අවිවාහක බව : ..............................................

3.3 උපන් දිනය - :

වර්ෂය : ☐☐☐☐ මාසය: ☐☐ දිනය: ☐☐

3.4 2019.07.19 දිනට වයස

අවුරුදු ☐☐ මාස: ☐☐ දින: ☐☐

3.5 දුරකථන අංකය:

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

4.0 අධ්‍යාපන සුදුසුකම් :

4.1 අ.පො.ස.(සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

i. විභාගයේ වර්ෂය හා මාසය : ................................................

ii. විභාග අංකය : ................................

iii. ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

4.2 අ.පො.ස.(සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර

i. විභාගයේ වර්ෂය හා මාසය : ................................................

ii. විභාග අංකය : ................................

iii. ප්‍රතිඵල

| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.0 වෘත්තීය සුදුසුකම් :..........................................................................................................
..........................................................................................................................

60. තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද :..........................................................................
..........................................................................................................................

7.0 ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් :

..........................................................................................................................

..........................................................................................................................

8.0 ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබී තිබේ ද?
(අදාළ කොටුවේ (√) ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

..........................................................................................................................

9.0 **අයදුම්කරුගේ සහතිකය :**

මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටසක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/ හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

.......................................

දිනය: ................................ අයදුම්කරුගේ අත්සන

10.0 **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ……………………………………………………………………… මයා/මිය/මෙය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිටදී ……………………….. දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

…………………………………
අත්සන සහතික
කරන නිලධාරියාගේ අත්සන

දිනය : ………………………..
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:……………………………………
තනතුර:…………………………
ලිපිනය:…………………..
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

(රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකය දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කල යුතුය.)

11.0 දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියාගේ සහතිකය :

දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පිය නොවන සේවා ගණයේ දුම්රිය කාර්ය සහායක /නවාතැන් බංගලා සහායක/ කාන්තා විශ්‍රාම ශාලා සේවිකා (අයදුම්කරනු ලබන තනතුර හැර ඉතිරිය කපා හරින්න )111 වන ශ්‍රේණිය සඳහා අයදුම් කරන මෙම ආයතනයේ …………………………………… තනතුර දරන ………………………………………………………………………………………… මයා/මිය/මෙය ගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මෙතෙක් මොනයම් ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කල හැක/නොහැක.

……………………………………………
ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

දිනය : ………………………..
ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සම්පූර්ණ නම:……………………………………
තනතුර:…………………………
ලිපිනය:…………………..
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)